රසායනික බන්ධන

ඔබේ විද්‍යාව පෙළපොතෙහි I කොටසේ පිටු අංක 164 සිට 181 දක්වා පිටු කියවා අවබෝධ කරගෙන පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) රසායනික බන්ධන යනු මොනවාද ?

2) රසායනික බන්ධන වර්ග 2ක් ඇත. ඒවා සඳහන් කරන්න.

3) ලෝහ මූලද්‍රව්‍ය පරමාණුවක් ඉලෙක්ට්‍රෝන පිට කිරීමෙන් ඇතිවන අයනය කුමක්ද ?

4) අලෝහ මූලද්‍රව්‍ය පරමාණුවක් ඉලෙක්ට්‍රෝන ලබාගෙන සාදන අයනය කුමක්ද ?

5) පහත වගුවේ හිස්තැන් පුරවන්න.

මූලද්‍රව්‍ය	පරමාණුවේ ඉලෙක්ට්‍රෝන වින්‍යාසය	අයනයේ ඉලෙක්ට්‍රෝන වින්‍යාසය	අයනයේ සංකේතය
Li	2,1		Li^+
Na	2,8,1		
Ca		2,8,8	
F	2,7		F^-
Cl	2,8,7		
O		2,8	

6) Na හා Cl පරමාණු අතර අයනික බන්ධන ඇතිවන ආකාරය පරමාණුවේ තිත් කතිර සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

7) අයනික සංයෝග සඳහා උදාහරණ 5ක් සඳහන් කරන්න.

8) ජල අණුවක H හා O පරමාණු අතර සහසංයුජ බන්ධන ඇතිවන ආකාරය පැහැදිලි කරන්න.

9) සහසංයුජ බන්ධන නිරූපණය කළ හැකි ආකාර 3 මොනවාද ?

10) පහත අණුවල ඇති සහසංයුජ බන්ධන රූප සටහන් මගින් නිරූපණය කරන්න.

i) CH_4 ii) O_2 iii) CO_2

11) පරමාණුක දැලිසක් ඇතිවන ආකාරය පැහැදිලි කරන්න.

12) පහත සඳහන් යෙදුම් පැහැදිලි කරන්න.
i) විද්‍යුත් සෘණතාවය
ii) ධ්‍රැවීයතාවය
iii) ධ්‍රැවීය සහසංයුජ බන්ධන
iv) නිර්ධ්‍රැවීය සහසංයුජ බන්ධන